# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1996 අංක 7 දරන
# සුරාබද්ද (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1996 මාර්තු මස 25 වන දින]

(ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.)

---

1996 මාර්තු මස 29 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

---

කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය.

මිළ : ශත 45 යි. තැපැල් ගාස්තුව : රු. 2.00 යි

**1996 අංක 7 දරන සුරාබදු (සංශෝධන) පනත**

[සහතිකය සටහන් කළේ 1996 මාර්තු මස 25 වන දින.]

එල. ඩී.—ඕ. 27/95

**සුරාබදු ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

**1.** මේ පනත 1996 අංක 7 දරන සුරාබදු (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය

2. මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන සුරාබදු ආඥාපනතේ 15 වන වගන්තියේ (ඇ) ඡේදයේ "බෘෘවරියක් හෝ ගුදමක්" යන වචන වෙනුවට "බෘෘවරියක්, මත්පැන් නිෂ්පාදනාගාරයක් හෝ ගුදමක්" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. 15 වන වගන්තිය සංශෝධනය කිරීම.

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ 16 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 16 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ—

(අ) එහි (අ) ඡේදයේ "ඉස්කාගාර සහ බෘෘවරී" යන වචන වෙනුවට "ඉස්කාගාර, බෘෘවරි සහ මත්පැන් නිෂ්පාදනාගාර" යන වචන ආදේශ කිරීමෙන්,

(ආ) එහි (ඇ) ඡේදයේ "බෘෘවරියක් හෝ ගුදමක්" යන වචන වෙනුවට "බෘෘවරියක්, මත්පැන් නිෂ්පා- දනාගාරයක් හෝ ගුදමක්" යන වචන ආදේශ කිරීමෙන්,

(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ "බෘෘවරියක් හෝ ගුදමක්" යන වචන වෙනුවට "බෘෘවරියක්, මත්පැන් නිෂ්පාදනාගාරයක් හෝ ගුදමක්" යන වචන ආදේශ කිරීමෙන්.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 22 වන වගන්තියේ (1) වන උපවගන් තියේ (ඇ) ඡේදයේ "ඉස්කාගාරයක හෝ බෘෘවරියක" යන වචන වෙනුවට "ඉස්කාගාරයක, බෘෘවරියක හෝ මත්පැන් නිෂ්පාදනා ගාරයක" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 22 වන වගන්තිය සංශෝධනය කිරීම.

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 23 වන වගන්තියේ (ඇ) ඡේදයේ (i) අනුඡේදයේ "ඉස්කාගාරයේ හෝ බෘෘවරියේ" යන වචන වෙනුවට "ඉස්කාගාරයේ, බෘෘවරියේ හෝ මත්පැන් නිෂ්පාදනාගාරයේ" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 23 වන වගන්තිය සංශෝධනය කිරීම.

2—ඩී 038519—6,130 (95/11)

ප්‍රධාන ප්‍රඥප්තියේ 46 වන වගන්තිය සංශෝධනය කිරීම.

6. ප්‍රධාන ප්‍රඥප්තියේ 46 වන වගන්තියේ (ඉ) ඡේදයේ " බෲවරියක් හෝ ගුදමක් " යන වචන වෙනුවට " බෲවරියක්, මත් පැන් නිෂ්පාදනාගාරයක් හෝ ගුදමක් " යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත් විය යුතු බව.

7. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත් විය යුතු ය.